වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
---------------------

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 17 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 17 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභාවේ නමට අයිතිය පවරාගෙන නොතිබූ වාහන 05 ක වටිනාකම් තක්සේරුකර අවසන් ගිණුම්වලට ගෙනවිත් තිබීම නිසා රු. 2,932,415 කින් මෝටර් වාහනවල වටිනාකම් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් සහ ගොඩනැගිලි 03 ක වටිනාකම් තක්සේරු නොකිරීම නිසා අවසන් ගිණුම්වල ඉඩම් ගොඩනැගිලිවල වටිනාකම් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 ගිණුම් ලේඛන හා පොත්පත් නොපැවැත්වීම

සභාව විසින් ස්ථාවර වත්කම් ලේඛනය, අලාභහානි ලේඛනය, ණය හිමි ලේඛනය, මිණුම් පොත , ඉඩම් විකුණුම් ලේඛනය යනාදි ලේඛන පවත්වා නොතිබුණි.

1.3.4 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්

පහත නිරීක්ෂයන් කරනු ලැබේ.

(අ) අදාල මුදල් වර්ෂයේ ලබා දෙන ලද රු. 429,634 ක් වටිනා අත්තිකාරම් 13 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් කර නොතිබුණි.

(ආ) රු. 136,723 ක ගෙවියයුතු වැටුප් අදාල සේවකයන්ට ගෙවා නොතිබුණි.

1.3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම
----------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 148(1) | | වාහන සහ සතුන් වෙනුවෙන් බදු පනවීමට ප්‍රදේශීය සභාවට බලය පවරා තිබුණද, එම වාහන සහ සතුන් සඳහා නියමිත බදු ප්‍රතිශතයක් අයකර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) | මුදල් රෙගුලාසි 315 | ගනන්දීමේ නිලධාරියා විසින් රජයේ වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සඳහා ආරක්ෂක වැඩ පිළිවෙලක් ගත්බව තහවුරු කර නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 571 | රු. 2,720,145 ක කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 28,045,949 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 26,888,493 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,157,456 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය
-------------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 104,850,307 ක් වි තිබූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 91,994,462 ක් වී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 12,855,845 කින් වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

2.3 ආදායම් පරිපාලනය
-----------------------

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය
------------------------------------

කොමසාරිස් විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2016<br>------<br>ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 2,571 | 2,235 | 4,579 |
| බදු කුලී | 13,271 | 10,660 | - |
| බලපත්‍ර ගාස්තු | 1,816 | 1,654 | - |
| වෙනත් ආදායම් | 59,336 | 65,601 | 70,783 |
| එකතුව | 76,994 | 80,150 | 75,362 |

2.4.2 වරිපනම් බදු

රු. 4,579,111 ක හිඟ වරිපනම් බදු මුදල සමාලෝචිත වර්ෂයේදී අයකර ගෙන නොතිබුණි.

2.4.3 වෙනත් ආදායම්

රු. 184,684 ක හිඟ ජල බදු මුදල සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී අයකර ගෙන නොතිබුණි.

2.4.4 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ මුදල් වන රු. 452,582 ක් ලබාගෙන නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාවූ කාලයට අදාලව ලැබියයුතු රු. 63,618,339 ක මුද්දර ගාස්තු අයකර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුස්තකාලයට පරිත්‍යාගය වශයෙන් ලැබුණු රු. 60,000 ක් අදාල අරමුණ සඳහා යොදවා ගෙන නොතිබුණි.

(ආ) සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 100 ක් වුවද, තත්‍ය කාර්ය මණ්ඩලය 97 කි. ඒ අනුව කාර්ය මණ්ඩල පුරප්පාඩු 07 ක් ද අතිරික්ත කාර්ය මණ්ඩලය 04 ක්ද විය.

(ඇ) වාර්ෂිකව විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රුස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

3.2 ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 884,992 ක් වටිනා ග්‍රාමීය පොළ ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල 2013 වර්ෂයේ සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේ ඉදිකරන ලද පෙර පාසල ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.
(ඈ) පික්කප් මොටර් රථය සහ ජංගම වතුර ටැංකිය සභාව විසින් ප්‍රයෝජනට ගෙන නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය
---------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙන් වෙන්කර තිබූ රු. 1,600,000 ක් වටිනා වැඩ සැලසුම් 07 ක් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණි.

3.4 අපද්‍රව්‍ය කළමනාකරණ
--------------------------

අපද්‍රව්‍ය වර්ගීකරණය කිරීමෙන් සහ ප්‍රතිචක්‍රියකරණයෙන් තොරව ගොඩගසා තිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
---------------------------------------

4.1 අයවැය පාලනය
-----------------

වියදම් ව්‍යුහය
---------------

අයවැය ගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 15,366 සිට රු. 2,034,113 දක්වා වියදම් විචලනයක් විගණනයේදී නිරීක්ෂණය විය.

4.2 පිළිතුරු ඉදිරිපත් නොකළ විගණන විමසුම්
------------------------------------------------

පළාත් පාලන යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ බහු කාර්ය ශාලා ගොඩනැගිලි ඉදිකිරීම 2011 සම්බන්ධයෙන් විගණන විමසුමට මෙතෙක් පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි.